# විෂයමාලා ආවරණය සඳහා යෝජිත අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය
# හතරවන ශ්‍රේණිය (දෙවන වාරය)

## 2022

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## යෝජිත වැඩසටහන සඳහා උපදෙස් මාලාව

2022 පාසල් වර්ෂය සඳහා පාසල්වල දෛනික පරිපාලන කටයුතු හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සාමාන්‍ය පරිදි පවත්වා ගැනීම උදෙසා කඩිනම් පියවර ගැනීමට සිදු වී තිබේ.

ඒ අනුව මෙම අධ්‍යයන වර්ෂය තුළ දී අනිවාර්යයෙන් ම අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත හඳුනා ගෙන ඊට අනුව කාලය වෙන් කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ එක් එක් ශ්‍රේණිවල දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් අන්තර්ගතවලින් අත්‍යවශ්‍ය ඉගෙනුම් කොටස් පමණක් මෙමගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම විෂය කොටස් සාධනය වූ විට දෙවන වාරයට අවශ්‍ය ඉගෙනුම් අවස්ථා සඳහා සුදුසුකම් ලබන බව වැඩිදුරටත් සඳහන් කරමු.

එමෙන් ම දැනටමත් දෙවන වාරයට අදාළ යම් පමණක විෂය කොටස් ප්‍රමාණයක් ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව විවිධතාවලින් යුතු ව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වී ඇත. එසේ වුවද අප විසින් යෝජනා කරනු ලබන්නේ පළමුවන වාරයට අදාළ ව සිසුන් විසින් අත්‍යවශ්‍යයෙන් ම අත්පත් කරගත යුතු විෂය කොටස් ය. මෙම යෝජිත විෂය කොටස්වලින් ද ඔබ පාසලේ ආවරණය වූ විවිධ විෂයය කොටස් තිබිය හැකි ය. එසේ වූ විට දී එම කොටස් අතහැර ඊළඟට ඇති විෂයය කොටසේ සිට පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට අප විසින් යෝජනා කරන්නෙමු.

එමෙන් ම එක් එක් විෂය අන්තර්ගත සඳහා යෝජිත කාලය ඔබ පන්ති කාමරයේ සිටින සිසුන්ගේ සාධනය මත නම්‍යශීලී ව හා සාධාරණ ව වෙනස් කර ගැනීමට ඔබට නිදහස ඇත. එනමුත් යෝජිත විෂය අන්තර්ගතවලින් අඩු නොකොට ඒ සියල්ල මනා ලෙස සම්පූර්ණ කිරීමේ වගකීම ද ඔබ සතු ය.

එක් එක් විෂය සඳහා ගුරුමාර්ගෝපදේශයට අනුව දෙවන වාරයට නිර්දිෂ්ට විෂය අන්තර්ගත මාර්ගගත ක්‍රමයට හෝ ඉතාමත් සරල පැහැදිලි කිරීම්වලින් අනතුරු ව නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් ලෙසට හෝ ආවරණය කළ හැකි ය. එසේ වුවත් නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දෙන ක්‍රියාකාරකම් සිසුන්ට අනවශ්‍ය බරක්, පීඩනයක් නොවන ආකාරයට ලබා දීම ද ඔබ සතු වගකීමකි.

එමෙන් ම අප විසින් යෝජනා කරනු ලබන අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගත ඒ ඒ විෂය තක්සේරුවට අනුව විධිමත් ලෙස තක්සේරු කිරීම ඔබ සතු වගකීමකි. මීට අමතර ව මාර්ගගත ක්‍රමයට සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමයට ආවරණය කරනු ලබන විෂය කොටස්වලට අදාළ ව සිසුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් නැවත පන්ති කාමරයට ගෙන්වා ගත යුතු ය. අනතුරු ව ඒවා සිසුන් ඉදිරියේ පරීක්ෂා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ සහ ඉදිරිපෝෂණ ලබා දී විෂය තක්සේරුවට අනුව තක්සේරු කිරීම ද සිදු කළ යුතු ය.

ඒ අනුව සෑම විෂයයක ම අදාළ වාරයට අපේක්ෂිත ඉගෙනුම් පල කරා සියලු ම සිසුන් ළඟා කරවීම ඔබ සතු වගකීමකි. කෙසේ වුවත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් සෞඛ්‍ය සම්පන්න ව, ආරක්ෂිත ව, ප්‍රීතිමත් ව සහ ක්‍රියාශීලී ව ඒ සඳහා යොමු කරලීමේ වගකීම ද ඔබ සතු ය. ඒ අනුව ශ්‍රී ලාංකේය ප්‍රාථමික අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ඉගෙනුම් කාර්යය ශක්තිමත් හා ඵලදායී කරලීමේ උතුම් අරමුණින් මේ සියල්ල ක්‍රියාත්මක කිරීමට ඔබට ශක්තිය ලැබේවා යි පතමු.

## මව්බස - සිංහල
## හතරවන ශ්‍රේණිය ( දෙවන වාරය)

හතරවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා ආවරණය කළ යුතු අත්‍යවශ්‍ය විෂය අන්තර්ගත පහත පරිදි යෝජනා කෙරෙයි. ඒ අනුව දී ඇති අනුක්‍රමයට අදාළ ව ඉගෙනුම් පල සාධනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය.

හතරවන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර හතරවන ශ්‍රේණියේ පළමුවන වාරයට අදාළ ඉගෙනුම් පල සාධනය වූවා දැයි මැන බැලීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුවාගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය. ඉන් පසු ව හතරවන ශ්‍රේණියේ දෙවන වාරය සඳහා අප විසින් යෝජනා කරනු ලබන විෂය අන්තර්ගත සඳහා යොමු විය හැකි ය.

හතරවන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගත පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිදු කළ යුතු ය. ඊට අමතර ව දෙවන වාරය සඳහා නිර්දිෂ්ට පස්වන නිපුණතාවයේ පළමුවන සහ දෙවන ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් ද, හයවන නිපුණතාවයේ සවන් දීමට සහ කතා කිරීමට අදාළ ක්‍රියාකාරකම් ද, අටවන නිපුණතාවයේ පළමුවන සහ දෙවන ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් ද, නවවන නිපුණතාවයේ පළමුවන, දෙවන සහ හතරවන ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් මාර්ගගත ක්‍රමය සහ නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ලබා දිය හැකි ය.

| හතරවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | L5<br>වාංමාලා සංවර්ධනය සඳහා සවන් දෙයි<br><br>S5<br>වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි<br><br>R5<br>වාංමාලා සංවර්ධනය සඳහා කියවයි<br><br>W5<br>වාංමාලා සංවර්ධනය සඳහා ලියයි | ■ වාංමාලා පෝෂණය සඳහා වචන එක් රැස් කර භාවිත කරයි<br><br>■ යුගල පද, ප්‍රස්තාව පිරුළු සහ ඉඟි වැකි නිවැරදි අර්ථ ගැන්වීම් සඳහා භාවිත කරයි | ■ සමානාර්ථවත් පද<br><br>■ විරුද්ධාර්ථවත් පද<br><br>■ යුගල පද<br><br>■ ප්‍රස්තාව පිරුළු<br><br>■ ඉඟි වැකි | ක්‍රියාකාරකම 03<br><br>ක්‍රියාකාරකම 04<br><br>ක්‍රියාකාරකම 05<br><br>ක්‍රියාකාරකම 06<br><br>ක්‍රියාකාරකම 07 | 65, 66<br><br>66-68<br><br>68, 69<br><br>69-72<br><br>73, 74 | පැය.03<br><br>පැය.03<br><br>පැය.03<br><br>පැය.03<br><br>පැය.02 |

| හතරවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | R6<br>සන්නිවේදනය සඳහා කියවයි<br><br>W6<br>සන්නිවේදනය සඳහා ලියයි | ▪ සුබ පැතුම් පත් නිර්මාණශීලී ව සකස් කර ඉදිරිපත් කරයි<br>▪ යම් අදහසක් කාටූන් මගින් ඉදිරිපත් කරයි<br>▪ දෙන ලද කරුණුවල සුවිශේෂතා කෙරෙහි අවබෝධයෙන් යුතු ව වගුගත කරයි.<br>▪ පෞද්ගලික ලිපියක් ලිවීමේ අරමුණු නිවැරදි ව පවසයි.<br>▪ පෞද්ගලික ලිපියක අඩංගු විය යුතු සුවිශේෂ කරුණු ප්‍රකාශ කරයි.<br>▪ පෞද්ගලික ලිපියක් ලිවීමේ හුරුව ලබයි. | ▪ සුබ පැතුම් පත්<br>▪ වගුගත කිරීම<br>▪ පෞද්ගලික ලිපි<br>▪ කාටූන් | ක්‍රියාකාරකම 01<br>ක්‍රියාකාරකම 02<br>ක්‍රියාකාරකම 03<br>ක්‍රියාකාරකම 04 | 77, 78<br>79<br>79-82<br>82, 83 | පැය.03<br>පැය.01<br>පැය.02<br>පැය.01 |

| හතරවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | L7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන් දෙයි<br><br>S7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි<br><br>R7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි<br><br>W7<br>භාෂාව හැසිරවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි | ■ ජන ක්‍රීඩාවක යෙදෙමින් ප්‍රායෝගික අද්දැකීම් ලබයි.<br><br>■ සාහිත්‍ය සමිතියක දී ඉදිරිපත් වීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.<br><br>■ සාහිත්‍ය සමිතියක් මෙහෙයවීමේ පරිචය ලබයි.<br><br>■ මාතෘකාවකට අදාළ ව කරුණු ගොනු කරයි. | ■ ජන ක්‍රීඩා<br><br>■ සාහිත්‍ය සමිති<br><br>■ මාතෘකාවකට අදාළ ව වාක්‍ය ලිවීම | ක්‍රියාකාරකම 01<br><br>ක්‍රියාකාරකම 02<br><br>ක්‍රියාකාරකම 03 | 84- 86<br><br>86-89<br><br>89, 90 | පැය.02<br><br>පැය.02<br><br>පැය.03 |

| හතරවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | L8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන් දෙයි<br><br>S8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි<br><br>R8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි<br><br>W8<br>ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි | ▪ කියවීමේ පුරුදු ප්‍රදර්ශනය සඳහා පුස්තකාලය භාවිත කරයි. | ▪ පුස්තකාල භාවිතය | ක්‍රියාකාරකම 03 | 95 | පැය.02 |

| හතරවන ශ්‍රේණිය - මව්බස (සිංහල) දෙවන වාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පලය | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගුරු මාර්ගෝපදේශ පිටු අංක | කාලය |
| | L9<br>අවබෝධය සඳහාත්, නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් සාවධාන ව සවන් දෙයි.<br><br>S9<br>අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව කතා කරයි.<br><br>R9<br>අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත කියවයි.<br><br>W9<br>අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථෝචිත ව ලියයි. | ▪ තොරතුරු සොයා එහි වැදගත් කරුණු ඉදිරිපත් කරයි. | ▪ තොරතුරු<br>▪ අන්තර්ජාලය | ක්‍රියාකාරකම 04<br><br>ක්‍රියාකාරකම 05 | 101, 102<br><br>103 | පැය.03<br><br>පැය.02 |
| | | | | | මුළු කාලය | පැය35 |

## ගණිතය

## හතරවන ශ්‍රේණිය (දෙවන වාරය)

ගණිතය විෂයමාලාවේ හතරවන ශ්‍රේණියේ දෙවන වාරයට අදාළ අත්‍යවශ්‍ය ම ඉගෙනුම් සංකල්ප සාධනය සඳහා අවශ්‍ය විෂය අන්තර්ගතය වෙන වෙන ම මෙහි ඇතුළත් කර ඇත. සිසුන් පීඩනයට පත් නොවන අයුරින් ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා මෙය උදවු කර ගන්න. මෙහි යෝජනා කර ඇති කාලය උචිත පරිදි ගළපා ගනිමින් ගුරු මාර්ගෝපදේශයේ දක්වා ඇති මගපෙන්වීම් ද ප්‍රයෝජනයට ගෙන ක්‍රියාකාරකම් සැලසුම් කර ගන්න.

හතරවන ශ්‍රේණියේ දෙවන වාරයට යෝජිත මෙහි සඳහන් විෂය අන්තර්ගතවලට අදාළ ක්‍රියාකාරකම් කිරීමට පෙර තුන්වන පළමුවන වාරයේ දී ගණිතය විෂය සඳහා අත්පත් කරගත යුතු අත්‍යවශ්‍ය විෂය කොටස් සිසුන් තුළ  සාධනය වී ඇද්දැයි පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පැය කිහිපයක් වෙන් කර  සිසුන්ගේ හැකියාව මැන බැලීමට සහ සිසුන්ගේ පෙර මතකය ආවර්ජනය කිරීමට ඔබ විසින් සකස් කරන ලද ක්‍රියාකාරකම් සිසුන්ට ලබා දිය යුතු ය. ඒ අනුව එක් එක් සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඔබ විසින් ලබා ගත යුතු ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අත්කරගෙන ඇති ද යන්න තහවුරු කරගන්න. ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් ගණිතය පෙළ පොතේ අභ්‍යාස සඳහා ද සිසුන් යොමු කරන්න.

සමහර නිපුණතාවලට අදාළ ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් පසු ව එම සංකල්ප තව දුරටත් තහවුරු කිරීම සඳහා නිවෙස් පාදක ඉගෙනුම් ක්‍රමය ඔස්සේ ද අභ්‍යාස සඳහා සිසුන් යොමු කළ හැකි ය.

හතරවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| ද්‍රව ප්‍රමාණයක් සුදුසු මිනුම් ඒකකයකින් මැන පෙන්වයි. | ■ ලීටර සහ මිලිලීටර භාවිතයෙන් ද්‍රව මනියි, වාර්තා කරයි. | ■ කුඩා දියර ප්‍රමාණ මැනීමේ දී මිලිලීටරය භාවිත කරයි.<br>■ මිලිලීටරය සඳහා වන සම්මත සංකේතය භාවිත කරයි.<br>■ ලීටර සහ මිලිලීටර භාවිතයෙන් විවිධ ද්‍රව ප්‍රමාණ මැන වාර්තා කරයි.<br>■ ලීටර සහ මිලිලීටර භාවිතයෙන් භාජනයකට අල්ලන ද්‍රව ප්‍රමාණය නිමානය කරයි. මැන සසඳයි.<br>■ ලීටර සහ මිලිලීටර ඒකක පරිවර්තන සිදු කරයි. | ● මිලිලීටරය හඳුනා ගැනීම<br>● ද්‍රව මැනීම<br>● නිමානය හා සැසඳීම<br>● ඒකක පරිවර්තනය | පාඩම 13 ක්‍රියාකාරකම 1 සිට 4 | 63 සිට 69 | පැය 3 |
| ද්‍රව්‍ය ප්‍රමාණයක බර සුදුසු මිනුම් ඒකකයකින් මැන ප්‍රකාශ කරයි. | ■ ග්‍රෑමය සහ කිලෝග්‍රෑමය භාවිතයෙන් බර මැන වාර්තා කරයි. | ■ ග්‍රෑමය භාවිතයෙන් කුඩා බර මනියි.<br>■ ග්‍රෑමය සඳහා ස්මමත සංකේතය (g) භාවිත කරයි.<br>■ ග්‍රෑම් සහ කිලෝග්‍රෑම භාවිතයෙන් බර මනියි.<br>■ ග්‍රෑම සහ කිලෝග්‍රෑම ඒකක පරිවර්තන සිදුකරයි. | ● ග්‍රෑමය හඳුනා ගැනීම.<br>● බර මැනීම<br>● ඒකක පරිවර්තනය | පාඩම 14 ක්‍රියාකාරකම 1 සිට 3 | 70 සිට 73 | පැය 3 |
| | ■ ප්‍රධාන දිශා හතර ආශ්‍රිත ප්‍රායෝගික<br>■ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | ■ ප්‍රධාන දිශා දක්වයි. නම් කරයි.<br>■ ප්‍රධාන දිශා හතර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිවැරදි ප්‍රතිචාර දක්වමින් නිරත වෙයි. | ■ ප්‍රධාන දිශා හතර ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් | පාඩම 15 ක්‍රියාකාරකම 1 සිට 3 | 74 සිට 79 | පැය 3 |

## හතරවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ ඉලක්කම් හතර තෙක් වූ සංඛ්‍යා ගෙනයාම එක් ස්ථානයකින් පමණක් සහිත එකතු කිරීමේ ගැටලු විසඳයි. | ■ ඉලක්කම් හතරේ සංඛ්‍යා දෙකක් ගෙනයාම එකස්ථානයෙන් දහයස්ථානයට පමණක් සහිත ව එකතු කරයි.<br>■ ඉලක්කම් හතර තෙක් වූ සංඛ්‍යා දෙකක එකතුව (ගෙනයාම දහයස්ථානයෙන් සියස්ථානයට පමණක් සහිත) ප්‍රකාශ කරයි. | ● සංඛ්‍යා එකතු කිරීමේ ගැටලු විසඳීම | පාඩම 16 ක්‍රියාකාරකම 1 සිට 2 | 80 සිට 82 | පැය 3 |
| | ■ දවස්, සති හා මාස අතර සම්බන්ධය හඳුනා ගෙන කටයුතු කරයි. | ■ සතියේ දවස් සහ අවුරුද්දේ මාස දොළහේ නම් අනුපිළිවෙළින් මතකයෙන් කියයි.<br>■ එක් එක් මාසයට ඇති දින ගණන ප්‍රකාශ කරයි.<br>■ දවස් හා සති, සති සහ මාස අතර සම්බන්ධතා හඳුනා ගෙන කටයුතු කරයි.<br>■ දිනය සහ දවස හඳුනා ගැනීම සඳහා දින දර්ශනය භාවිත කරයි. | ● දවස්, සති හා මාස අතර සම්බන්ධය<br>● මාසයකට ඇති දින ගණන | පාඩම 17 ක්‍රියාකාරකම 1 සිට 3 | 85 සිට 89 | පැය 3 |

## හතරවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ ඉලක්කම් තුන තෙක් වූ සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් ගෙන ඒම දහයස්ථානයෙන් එකස්ථානයට පමණක් සහිත ව අඩු කිරීමේ සරල ගැටලු විසඳයි. | ■ 99ට නොවැඩි සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් (දහයස්ථානයේ සිට එකස්ථානයට ගෙන ඒම සහිත ව) අඩු කර පිළිතුර ප්‍රකාශ කරයි.<br>■ ඉලක්කම් තුනේ සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් (දහයස්ථානයේ සිට එකස්ථානයට ගෙන ඒම සහිත ව) අඩු කර පිළිතුර ප්‍රකාශ කරයි.<br>■ ඉලක්කම් තුන තෙක් වූ සංඛ්‍යාවකින් එයට අඩු සංඛ්‍යාවක් (ගෙන ඒම දහයස්ථානයෙන් එකස්ථානයට පමණක් සහිත ව) අඩු කිරීමේ සරල ගැටලු විසඳයි. | ● සංඛ්‍යා අඩු කිරීමේ ගැටලු විසඳීම | පාඩම 18 ක්‍රියාකාරකම 1 සහ 4 | 90 සිට 94 | පැය 4 |
| | ■ දැනට භාවිතයේ පවතින රු.5000 තෙක් වූ කාසි සහ නෝට්ටු භාවිතයෙන් සරල ගනුදෙනුවල නිරත වෙයි. | ■ දැනට භාවිතයේ පවතින රුපියල් සහ සත කාසි හඳුනා ගෙන නම් කරයි.<br>■ දැනට භාවිතයේ පවතින රු.5000 තෙක් නෝට්ටු හඳුනා ගෙන නම් කරයි.<br>■ ගනුදෙනු සඳහා නෝට්ටු සහ කාසි භාවිත කරයි. | ● රුපියල් සහ සත කාසි හඳුනා ගැනීම<br>● රු.5000 තෙක් නෝට්ටු හඳුනා ගැනීම<br>● සරල ගනුදෙනු | පාඩම 19 ක්‍රියාකාරකම 1 සිට 4 | 95 සිට 98 | පැය 4 |

# හතරවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ 10 තෙක් සංඛ්‍යාවක් 3න් සහ 4න් ගුණ කරයි. | ■ 3හි සහ 4හි ගුණන වගු ගොඩනගයි.<br>■ 10 තෙක් සංඛ්‍යාවක් 3න් ගුණ කර පිළිතුර ප්‍රකාශ කරයි.<br>■ 10 තෙක් සංඛ්‍යාවක් 4න් ගුණ කර පිළිතුර ප්‍රකාශ කරයි. | ● 3 සහ 4 ගුණන වගු<br>● 3න් සහ 4න් ගුණ කිරීම. | පාඩම 20 ක්‍රියාකාරකම 1 සිට 4 | 99 සිට 105 | පැය 4 |
| | ■ දිග මැනීමට අදාළ එකතු කිරීමේ සහ අඩු කිරීමේ සරල ගැටලු විසඳයි. | ■ මීටර සහ සෙන්ටිමීටර ඇතුළත් සරල එකතු කිරීමේ ගැටලු විසඳයි.<br>■ මීටර සහ සෙන්ටිමීර ඇතුළත් සරල අඩු කිරීමේ ගැටලු විසඳයි. | ● දිග මැනීම හා සම්බන්ධ එකතු කිරීමේ හා අඩු කිරීමේ ගැටලු විසඳීම. | පාඩම 21 ක්‍රියාකාරකම 2 සිට 3 | 107 සිට 110 | පැය 2 |
| දවසේ නිශ්චිත අවස්ථාවලට අදාළ වේලාව සැබෑ ඔරලෝසු මුහුණතකින් පෙන්නුම් කරයි. | ■ පැය දොළහේ ඔරලෝසුවේ දැක්වෙන වේලාව කියවයි.<br>■ මිනිත්තු, පැය සහ දවස් අතර සම්බන්ධය හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | ■ පැය දොළහේ ඔරලෝසුවේ දැක්වෙන වේලාව කියවයි.<br>■ පැය දොළහේ ඔරලෝසුවේ වේලාව දක්වයි.<br>■ දවස් හා පැය අතර සම්බන්ධය හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>■ පැය හා මිනිත්තු අතර සම්බන්ධය විස්තර කරයි. | ● වේලාව කියවීම.<br>● දවස්, පැය හා මිනිත්තු අතර සම්බන්ධය | පාඩම 22 ක්‍රියාකාරකම 1 සිට 4 | 111 සිට 116 | පැය 3 |

## හතරවන ශ්‍රේණිය - ගණිතය

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | නිපුණතාව | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | ගු.මා.දේ. පිටු අංකය | කාලය |
|---|---|---|---|---|---|---|
| | ■ ඉලක්කම් දෙකේ සංඛ්‍යා 3න් සහ 4න් බෙදීමේ ගැටලු විසඳයි. | ■ ප්‍රායෝගික ක්‍රම ඇසුරෙන් ඉලක්කම් දෙකේ සංඛ්‍යා 3න් සහ 4න් බෙදයි.<br>■ ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක් 3න් බෙදා පිළිතුර ප්‍රකාශ කරයි.<br>■ ඉලක්කම් දෙකේ සංඛ්‍යාවක් 4න් බෙදා පිළිතුර ප්‍රකාශ කරයි.<br>■ ඉලක්කම් දෙකේ කවර හෝ සංඛ්‍යාවක් 3න් සහ 4න් බෙදීමේ සරල ගැටලු විසඳයි. | ● සංඛ්‍යා 3න් සහ 4න් බෙදීම. | පාඩම 23 ක්‍රියාකාරකම 1 සිට 5 | 117 සිට 122 | පැය 4 |
| මුළු පැය ගණන | | | | | | පැය 36 |

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
## හතරවන ශ්‍රේණිය (දෙවන වාරය)

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ හතරවන ශ්‍රේණියට අදාළ අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතය මෙහි දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පරිසර ගවේෂණය, විද්‍යාත්මක සංකල්ප භාවිතය සිසුන් සමග සිදු කළ යුතු අතර මෙහි සඳහන් අනෙකුත් ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් විශේෂයෙන් සෞන්දර්ය, ක්‍රීඩා හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් නිවෙස පාදක ව සිදු කිරීමට ද සිසුන් යොමු කළ යුතු ය. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට අදාළ කවි, ගීත ආදියෙහි අර්ථය ගායනයට පෙර සිසුන්ට පැහැදිලි කරමින් ඊට අදාළ ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

චිත්‍ර ඇඳීමේ දී, ඇඹීමේ දී, ආකෘති ගොඩනැගීමේ දී සිසුන්ගේ ඇති දක්ෂතාවලින් ම සිය නිර්මාණ එළිදැක්වීමටත් ඒවා අගය කරමින් ඔවුන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමටත් උත්සුක විය යුතු ය. නිවෙස් පාදක ව ක්‍රියාකාරකම් සිදු කරන සෑම අවස්ථාවක දී ම සිසුන්ගේ හැකියා වර්ධනය වන පරිදි ඊට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් ම කිරීම සඳහා යොමු කළ යුතු ය. සිසු නිර්මාණ පාසලට පැමිණෙන දිනයන්හි රැගෙන ඒමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ගන්න. කණ්ඩායම් ලෙස හෝ තනි තනි ව ප්‍රදර්ශනය කිරීමටත් ඒවා අගය කිරීමටත් කටයුතු කරන්න.

සිසුන් තුළ යහපත් ආකල්ප ඉස්මතු වන ආකාරයට සෑම ක්‍රියාකාරකමක් ම ගොඩනගා ගන්න. **ආදරය, කරුණාව, දයාව වැනි සංවර්ධනාත්මක චිත්තවේග දියුණු කිරීමටත්** කේන්තිය, හිංසාව, රිදවීම වැනි අහිතකර චිත්තවේග පාලනය කිරීමටත් සෑම ක්‍රියාකාරකමකින් ම සමාජ හිතවාදී චර්යා ඉස්මතු කිරීමටත් වග බලා ගන්න.

**අන්මත ඉවසීම, අන් අයට ගරු කිරීම, නායකත්වයට ගරු කිරීම, සාමූහික ව කටයුතු කිරීම** ආදී සමාජ කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට කටයුතු කරන මෙන් තව දුරටත් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

මෙහි ඉදිරිපත් කර ඇති තේමා යටතේ ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි විෂයයට අදාළ ක්‍රියාකාරකම් සිදු කරන්න. එහි දී ගුරු මාර්ගෝපදේශයේ දෙන ලද උපදෙස් අනුව කටයුතු කරන්න. ගීතවලට සහ වචනවලට අදාළ ශ්‍රව්‍ය පට (Audio materials) www.nie.lk - Downloads - other materials - English - ABOE මගින් ලබා ගන්න.

## හතරවන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| කණ්ඩායමක් ලෙස ආහාරයක් පිළියෙල කර සතුටින් භුක්ති විඳී.<br><br>ආහාර තෝරා ගැනීමේ දී ප්‍රවේසම් සහිත ව කටයුතු කරයි. | 6. අපේ ආහාර | • සෞඛ්‍යවත් ජීවිතයක් පවත්වා ගැනීම සඳහා ආහාර වේල් නියමිත වේලාවට ගැනීමේ වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>• ගුණාත්මක හා ඖෂධීය ගුණයෙන් යුතු පාන වර්ග පරිභෝජනයට යොමු වෙයි.<br>• ආහාර නාස්ති වන අයුරු හා කල් තබා ගන්නා ආකාරය පිළිබඳ දැනුම්වත්භාවයෙන් යුතු ව කටයුතු කරයි.<br>• ආහාර ගැනීමේ සිරිත්විරිත් හා යහපුරුදු පිළිපදියි.<br><br>• අනාරක්ෂිත ආහාර හේතුවෙන් වැලැඳිය හැකි රෝගාබාධ පිළිබඳ අවබෝධයෙන් යුතු ව පවිත්‍ර බවින් යුතු ආහාර පරිභෝජනයට යොමු වෙයි.<br><br>• නිවැරදි පිළිවෙත් අනුගමනය කරමින් ආහාර පිළිගන්වයි. | • නිරෝගී වැඩීමකට මිශ්‍ර ආහාරවේලක ඇති අවශ්‍යතාව විස්තර කරයි.<br>• නීරෝගී පැවැත්මට ඉවහල් වන ඖෂධීය ගුණයෙන් යුතු ආහාර හා පාන වර්ග හඳුනා ගෙන ඒවා පරිභෝජනයට යොමු වෙයි.<br><br>• ආහාර කල් තබා ගත හැකි විවිධ ක්‍රම හඳුනා ගෙන විස්තර කරයි.<br><br>• ආහාර වර්ග අපිරිසිදු වන විවිධ ක්‍රම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අනාරක්ෂිත ආහාර පරිභෝජනය නිසා වැලැඳිය හැකි රෝගාබාධ පිළිබඳ අවබෝධයෙන් යුතු ව ඒවායින් වැළකෙන ආකාරයට කටයුතු කරයි.<br><br>• ආහාර පිළිගැන්වීමේදී පවත්වා ගත යුතු නිවැරදි පිළිවෙත් අනුග මනය කරයි. | 01 - 07 | 285-292 | පැය 6 |

## හතරවන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ආරක්ෂාව සඳහා වන සංකේත නිවැරදි ව හඳුනා ගෙන ප්‍රවේශම් සහිත ව කටයුතු කරයි. | 7. ආරක්ෂාව සහ පරිස්සම | • අනතුරු සිදුවිය හැකි අයුරු පිළිබඳ ව දැනුම්වත් බවින් යුතු ව ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>• තාක්ෂණික මෙවලම් හා විවිධ ශක්තීන් භාවිතයෙන් ඇති වියහැකි හානි පිළිබඳ විමසිලිමත් බවෙන් යුතුව කටයුතු කරයි.<br>• බෝවන හා බෝ නොවන රෝග වැලඳීම වළ හැකි සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳ ව දැනුම්වත් බවින් යුතු ව කටයුතු කරයි.<br>• ආරක්ෂාව පිළිබඳ අවධානයෙන් යුතුව ප්‍රතික්‍රියා වේග වර්ධනය වන ක්‍රියාකාරකම්වල නියැලෙයි | • ස්වාභාවික හේතුන් නිසා හා මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදු විය හැකි අනතුරු හඳුනා ගෙන ඒවායින් ආරක්ෂා වෙමින් කටයුතු කරයි.<br>• ආගන්තුක පුද්ගලයන් සමඟ කටයුතු කිරීමේ දී ආරක්ෂිත ව හා පරිස්සම් සහිත ව ක්‍රියා කරයි.<br>• බෝ වන රෝග හා බෝ නොවන රෝග වැලඳීම වළ යුතු දේ පි අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.<br>• ආරක්ෂාව හා පරිස්සම පිළිබඳව සැළකිලිමත් වෙමින් නිර්මාණාත්මක ක්‍රීඩා වල නියැලෙයි. | 01 - 08 | 296-302 | පැය 6 |

## හතරවන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පාරිසරික සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා දායක වෙයි.<br><br>එළිමහනේ කරනු ලබන අත්හදා බැලීමකින් ලද නිරීක්ෂණ හා ප්‍රතිඵල තමාගේ වචනයෙන් ලියයි. | 8. ජලය | • ජලය සමඟ විවිධ දේ ක්‍රියා කරන ආකාරය ගවේෂණය කරමින් වාර්තා කරයි.<br><br>• විවිධ අයුරින් සපයා ගන්නා ජලය කාර්යක්ෂම කළමනාකරණයකින් යුතු ව සුරක්ෂිත ලෙස පරිභෝජනයට ගනියි.<br><br>• ජලයෙන් විය හැකි හානි හා අනතුරු පිළිබඳ ව විමර්ශනය කර ඒවා අවම කර ගැනීමට දායක වෙයි.<br><br>• ජලයේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ විවිධ නිර්මාණවල යෙදෙයි.<br>• ජලය හා සබැඳි විවිධ අවස්ථාව වින්දනාත්මකව ඉදිරිපත් කරයි. | • ජලයේ ස්වභාවය වෙනස් වන අයුරු අත්හදා බලයි.<br><br>• ජලයේ ක්‍රියාකාරීත්වය සොයා බලා වාර්තා කරයි.<br><br>• අපවිත්‍ර ජලය නිසා ඇති වන හානි අවම කර ගැනීමට කටයුතු කරයි.<br><br>• ජලය ආශ්‍රයෙන් ක්‍රියා කරවිය හැකි නිර්මාණ ඉදිරිපත් කරයි.<br><br>• ජලය උපයෝගී කරගෙන විවිධ නාද නිපදවන ආකාරය පිළිබඳ ව වින්දනාත්මකව අත්දැකීම් ලබයි. | 01-10 | 304-310 | පැය 7 |

## හතරවන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| තමන්ට සේවා සපයන පුද්ගලයන් කෙරෙහි කෘතවේදී බව ප්‍රදර්ශනය කරයි. | 9. ගමනාගමනය | • පාරේ ගමන් කරන්නන් විසින් පිළිපැදිය යුතු නීති රීති හා ආචාරධර්ම පිළිබඳ අවබෝධයන් යුතු ව මාර්ග ඵලදායී ව හා සුරක්ෂිත ව භාවිත කරයි.<br>• වාහන වලින් නිකුත් කරන අහිතකර බලපෑම් අධ්‍යනය කර ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>• පොදු වාහනවලින් ඉටු කරන සේවාවන් අගයමින් ඒවා සුරැකීමට දායක වෙයි.<br>• ගමනාගමනය හා සම්බන්ධ විවිධ අවස්ථා අලළා නිර්මාණකරණයේ යෙදෙයි.<br>• ගමනාගමනය හා සම්බන්ධ හැසිරීම් පිළිඹිඹු වන වින්දනාත්මක ව ඉදිරිපත් කරයි. | • මහමඟ ගමන් කිරීමේ දී මාර්ග සංඥාවලට අවනත වෙමින් අනුගමනය කළ යුතු නීති රීති පිළිපදිමින් කටයුතු කරයි.<br>• මහමඟ ගමන් කිරීමේ දී මාර්ග නීති රීති නොපිළිපැදීමෙන් විය හැකි අනතුරු හඳුනාගෙන ඒවායින් වැළකීමට අවශ්‍ය පියවර ප්‍රකාශ කරයි.<br>• ගමනාගමනය සඳහා යොදාගන්නා වාහන හා ඒවායින් ඇති ප්‍රයෝජන ප්‍රකාශ කරයි.<br>• පොදු වාහන ආරක්ෂා කිරීම සඳහා කළ හැකි දේ විස්තර කරයි.<br>• ගමනාගමනය සම්බන්ධ හැසිරීම් පිළිබිඹු වන නිර්මාණාත්මක ක්‍රීඩා වල නිරත වෙයි. | 01-06 | 312-316 | පැය 7 |

## හතරවන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| පැළයක වර්ධනය විමසිලිමත් ව නිරීක්ෂණය කරමින් සොබා දහමේ පැවත්මට දායක වෙයි. | 10. ගෙවත්ත | • සැලසුම් කරනු ලැබූ ගෙවත්තකින් එදිනෙදා තම නිවසට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිපදවා ගැනීමට දායක වෙයි.<br><br>• බෝග වගාවන් ආරක්ෂා කර ගැනීමට යොදන උපක්‍රම පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.<br>• කෘෂිකර්මාන්තය හා බැඳුණු සංස්කෘතික වටිනාකම අගය කරයි.<br>• ගෙවත්තක සුන්දරත්වය හා අගය මතු කර දැක්වෙන නිර්මාණවල වින්දනාත්මකව නියැලෙයි. | • බෝග පැළ කිරීමේ විවිධ ක්‍රම පිළිබඳ ව අත්දැකීම් ලබයි.<br>• ගෙවතු අලංකරණ ක්‍රියාකාරකම් සඳහා සාමූහික ව සහභාගි වෙයි.<br>• බෝග වගාව ආරක්ෂා කිරීමේ වැදගත්කම හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br><br>• බෝග වගාව ආරක්ෂා කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමශිල්ප අත්හදා බලයි.<br>• නූතන ක්‍රමශිල්ප බෝග වගාවේ ආරක්ෂාවට බලපාන ආකාරය විමර්ශනය කරයි.<br>• රසායනික පොහොර හා කෘමිනාශක භාවිතයෙන් ස්වාභාවික පරිසරයට සිදු වන හානි හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• ගෙවත්තෙන් සපයා ගෙත් දෙයකින් ආහාරයක් පිළියෙල කොට සාමූහිකව භුක්ති විඳියි.<br>• ගෙවතු වගාවේ අසිරිය පිළිබඳව රංගනය ඉදිරිපත් කරයි. | 01-06<br><br>08 | 318 - 323 | පැය 8 |

හතරවන ශ්‍රේණිය -. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

| අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා | තේමාව | නිපුණතාවය | ඉගෙනුම් පලය | ක්‍රියාකාරකම | ගුරු මා.දේ. පිටු අංක | කාලය |
|---|---|---|---|---|---|---|
| ගැටලුවක් විසඳා කිරීමට විකල්ප ක්‍රම යෝජනා කරයි. | 11. වැඩ පහසු කිරීමේ මං | • වැඩ පහසු කර ගැනීම සඳහා වර්තමානයේ මෙන් ම අතීතයේ ද යොදා ගත් ක්‍රමශිල්ප අධ්‍යයනය කර වාර්තා කරයි.<br>• වැඩ පහසු කර ගැනීමට ගුණාත්මක නිමාවක් සඳහා සැළසුම්ගතව, පිළිවෙළට හා ක්‍රමවත්ව වැඩ කිරීමට හුරු වෙයි.<br>• සේවා සැපයීමේ දී හා ලබා දීමේදී ආචාරශීලීව හා නීතිගරුකව කටයුතු කරයි.<br>• විදුලිය, චුම්බක හා සරල යන්ත්‍ර භාවිතයෙන් වැඩ පහසු කර ගන්නා අයුරු විමර්ශනය කර වාර්තා කරයි.<br>• එදිනෙදා වැඩ පහසුකර ගැනීමට යොදා ගත හැකි විවිධ ශක්තීන් පිළිබඳ ව අත්හදා බැලීම් කරමින් වින්දනයක් ලබයි.<br>• සහයෝගය සහ සාමුහිකත්වය මගින් සාර්ථකත්වය අත්විඳිය හැකි ක්‍රීඩාවල නිරත වෙයි. | • වැඩ පහසු කර ගැනීමට අතීතයේ යොදා ගත් ක්‍රමශිල්ප කිහිපයක් ප්‍රකාශ කරයි.<br>• ඇදීම හා තල්ලු කිරීම පහසු කර ගැනීමේ ක්‍රම ප්‍රායෝගික ව අත්හදා බලයි.<br>• සැලසුම්ගත ව, ක්‍රමවත්ව හා පිළිවෙළට කටයුතු කිරීම මගින් කාර්යය පහසු කර ගනියි.<br>• යම් පුද්ගලයෙකුගෙන් හෝ ස්ථානයකින් හෝ සේවාවක් ලබා ගැනීමේදී ලබා දීමේදී ආචාරශීලී හා නීතිගරුක හැසිරීම් ප්‍රදර්ශනය කරයි.<br>• යම් කාර්යයක් කිරීමේ දී සරල යන්ත්‍ර භාවිතයෙන් වැඩ පහසු කර ගනියි.<br>• චුම්බකයක ලක්ෂණ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා උචිත පරිදි යොදා ගනියි.<br>• සරල විද්‍යුත් පරිපථවල ක්‍රියාකාරීත්වය අත්හදා බලයි.<br>• බල ශක්ති ප්‍රභව භාවිත කරමින් නිර්මාණ කරයි.<br>• සහයෝගයෙන් කටයුතු කිරීම මගින් සාර්ථකත්වය අත් විඳිය හැකි ක්‍රීඩාවල නිරත වෙයි. | 01 - 06 | 325-329 | පැය 8 |
| | | | | | මුළු කාලය | පැය 42 |

හතරවන ශ්‍රේණිය - දෙවන ජාතික භාෂාව

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| 11 සිට 15 දක්වා සංඛ්‍යා නාම දෙමළ භාෂාවෙන් කියයි | **பதினொன்று** (පදිනොන්රු) එකොළහ<br>**பன்னிரண்டு** (පැන්නිරණ්ඩු) දොළහ<br>**பதின்மூன்று** (පදින්මූන්රු) දහතුන<br>**பதின்நான்கு** (පදිනාන්ගු) දාහතර<br>**பதினைந்து** (පදිනෛන්දු) පහළොව | 1-3 | 410 - 412 | පැය 2 |
| එදිනෙදා කතාබහේ දී ස්ථානය නිශ්චිතව දැක්වීම සඳහා සුදුසු යෙදුම් භාවිත කරයි | **அங்கே** ( අංගේ )<br>එහේ /අතන/ අතනට /අතනින් / එහෙන්<br><br>**இங்கே** (ඉංගේ)<br>මෙහේ /මෙතන /මෙතනට /මෙතැනින්/මෙහෙන්<br><br>**முன்னால்** (මුන්නාල්)<br>ඉදිරියෙන් /ඉදිරියට<br><br>**பின்னால்** (පින්නාල්)<br>පිටුපස/ පිටුපසින් /පිටුපසට | 1-4 | 413 - 415 | පැය 4 |

| නිපුණතාව | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම් | ගුරු මාර්ගෝපදේශයේ සඳහන් පිටු අංකය | කාලය (පැය) |
|---|---|---|---|---|
| තම සමීපතමයන් සමග සුහද කතා බහේ යෙදෙයි | **நான் ராணி நீங்கள் யார் ?**<br>නාන් රාණි නීංගල් යාර් - මම රාණි ඔබ කවුද?<br><br>**எனது பெயர் சமன்**<br>එනදු පෙයර් සමන් - මගේ නම සමන්<br><br>**எனக்கு அப்பம் வேண்டும்**<br>එනක්කු අප්පම් වේණ්ඩුම් - මට ආප්ප ඕනේ<br><br>**உங்களுக்கு தண்ணீர் வேண்டுமா ?**<br>උංගලුක්කු තණ්ණීර් වේණ්ඩුමා? - ඔයාට වතුර ඕනෙද?<br><br>**இல்லை**<br>ඉල්ලෛ - නෑ<br><br>**ஆம்**<br>ආම් - ඔව්<br><br>**எனக்கு தண்ணீர் வேண்டாம்.**<br>එනක්කු තණ්ණීර් වේණ්ඩාම් - මට වතුර එපා<br><br>**நீங்கள் யார்?**<br>නීංගල් යාර් - ඔබ කවුද<br><br>**நான் சமன்.**<br>නාන් සමන් - මම සමන් | 1-3 | 416 - 419 | පැය 4 |
| | | | මුළු කාලය | පැය 10 |

**සැ.යු.**

සියලු ආගම් විෂයයන්ට අදාළ විෂය අන්තර්ගත ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ යෝජනා කර ඇති කාලයම සුදුසු පරිදි සැලසුම් කර ගැනීමට යෝජිත ය.